T.R.I. ADVISORY CIRCULAR No.PU 2

නිකුත් කිරීම: 2024 පෙබරවාරි

අනුක්‍රමික අංක: 02/24

තේ වගාවේ රෝග රසායනිකව පාලනය කිරීම

(මෙම චක්‍රලේඛය මගින් 2023 මාර්තු මස නිකුත් කරන ලද අනුක්‍රමික අංක 02/23, PU2 උපදෙස් චක්‍රලේඛය සහ එයට අදාළ පෙර චක්‍රලේඛ ප්‍රතිස්ථාපනය වන අතර DM1, DM2, DM3, DM4, DM5, DM6 සහ DM7 යන උපදෙස් චක්‍රලේඛ සමඟ සම්බන්ධ වේ)

1. හැඳින්වීම

තේ වගාවේ රෝග කළමනාකරණය සඳහා, උපදෙස් චක්‍රලේඛ DM 1 – DM 7 හි නිශ්චිතව දක්වා ඇති පරිදි ශෂ්‍ය විද්‍යාත්මක, ජීව විද්‍යාත්මක හා රසායනික ක්‍රම ඇතුළත් ඒකාබද්ධ ප්‍රවේශයක් නිර්දේශ කර ඇත.

තේ වගාවේ රෝග පාලනය කිරීම සඳහා දිලීර නාශක මූලික කාණ්ඩ දෙකක් භාවිතා කරයි. ඒවා ස්පර්ශ දිලීර නාශක හෝ සංස්ථානික දිලීර නාශක වේ. ස්පර්ශ දිලීර නාශක මගින් රෝග කාරකය (දිලීර) විනාශ වන්නේ ස්පර්ශ වීමෙන් පමණක් වන අතර, ශාක පටකවලට අවශෝෂණය වීමක් සිදුනොවේ. සංස්ථානික දිලීර නාශක, ශාක පටක තුළට අවශෝෂණය වන බැවින් වඩා හොඳ රෝග පාලනයක් සිදුවන නමුත්, දිලීර නාශක අවශේෂ දීර්ඝ කාලයක් තිස්සේ ඉතිරි වී තිබිය හැක. මෙහි ප්‍රතිඵලයක් ලෙස අවසාන නිෂ්පාදනය ලෙස ලබා ගන්නා නිමි තේවල, දිලීර නාශක අවශේෂ අඩංගුවීමේ හැකියාවක් පවතී. එබැවින්, සංස්ථානික දිලීරනාශක භාවිතා කරමින් රෝග පාලනය කිරීමේ දී සියලු පූර්වාරක්ෂාවන් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා, නියමිත පෙර අස්වනු කාල පරතර (PHI) අනුගමනය කරමින්, තේ පර්යේෂණ ආයතන මාර්ගෝපදේශයන්ට අනුව නිර්දේශිත දිලීර නාශක පමණක් නිර්දේශිත සාන්ද්‍රණයෙන් භාවිතා කිරීම ඉතා වැදගත් වේ.

2. බුබුලු අංගමාර රෝගය

2.1. තේ තවාන

සක්‍රීය ද්‍රව්‍යය(a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව (නැප්සැක් ඉසිනයකින් පැළ 30,000 ක් සඳහා)	PHI (සති)
ස්පර්ශ දිලීර නාශක: දින 4 ක ඉසින කාල පරාසයක් ඇතිව				
කොපර් ඔක්සයිඩ්	සීඅයිසී කොපර් 50% WP	N230000	ජලය ලීටර් 45 ක ග්‍රෑම් 120	අදාළ නැත
කොපර් හයිඩ්‍රොක්සයිඩ්	චැම්ප් කොපර් හයිඩ්‍රොක්සයිඩ් 37.5%WDG	N690000	ජලය ලීටර් 45 ක ග්‍රෑම් 45	
කොපර් සල්ෆේට්	කියුප්‍රොසැට් ® 345 g/L SC	P750000	ජලය ලීටර් 45 ක මිලිලීටර් 200	
සංස්ථානික දිලීර නාශක: දින 10 ක ඉසින කාල පරාසයක් ඇතිව				
හෙක්සකොනසෝල්	ඉරේසර් ඊසී	F020100	ජලය ලීටර් 45 ක මිලි ලීටර් 25	අදාළ නැත
ටෙබුකොනසෝල්	ෆොලිකර් 250 ඊසී	9370100		
ප්‍රොපිකොනසෝල්	බම්පර්	N750000		

2.2. දලු නොකඩන ක්ෂේත්‍ර (නොමේරූ/මට්ටම් කපන තෙක් කප්පාදු කල ක්ෂේත්‍ර) සඳහා

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව (නැප්සැක් ඉසිනයකින් හෙක්ටයාරයකට)	PHI (සති)
ස්පර්ශ දිලීර නාශක: දින 4- 5 ක ඉසින කාල පරාසයක් ඇතිව				
කොපර් ඔක්සයිඩ්	සිඅයිසි කොපර් 50% WP	N230000	ජලය ලීටර් 170 ක ග්‍රෑම් 450 -560	අදාළ නැත
කොපර් හයිඩ්‍රොක්සයිඩ්	චැම්ප් කොපර් හයිඩ්‍රොක්සයිඩ් 37.5%WDG	N690000	ජලය ලීටර් 170 ක ග්‍රෑම් 136 -170	
කොපර් සල්ෆේට්	කියුප්‍රොසැට් ® 345 g/L SC	P750000	ජලය ලීටර් 170 ක මිලිලීටර් 700 - 850	
සංස්ථානික දිලීර නාශක: දින 10 ක ඉසින කාල පරාසයක් ඇතිව				
හෙක්සකොනසෝල්	ඉරේසර් ඊසී	F020100	ජලය ලීටර් 170 ක මිලි ලීටර් 85	අදාළ නැත
ටෙබුකොනසෝල්	ෆොලිකර් 250 ඊසී	9370100		
ප්‍රොපිකොනසෝල්	බම්පර්	N750000		

2.3 දලු නෙලන ක්ෂේත්‍ර සඳහා

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව (හෙක්ටයාරයකට)	PHI (සති)
ස්පර්ශ දිලීර නාශක: දින 7 - 10 ක ඉසින කාල පරාසයක් ඇතිව				
කොපර් ඔක්සයිඩ්	සිඅයිසි කොපර් 50% WP	N230000	ජලය ලීටර් 170 ක ග්‍රෑම් 280 - 420	1
කොපර් හයිඩ්‍රොක්සයිඩ්	චැම්ප් කොපර් හයිඩ්‍රොක්සයිඩ් 37.5%WDG	N690000	ජලය ලීටර් 170 ක ග්‍රෑම් 136 -170	
කොපර් සල්ෆේට්	කියුප්‍රොසැට් ® 345 g/L SC	P750000	ජලය ලීටර් 170 ක මිලිලීටර් 700 - 850	
සංස්ථානික දිලීර නාශක: දළු නෙලන ක්ෂේත්‍ර සඳහා සංස්ථානික දිලීර නාශක නිර්දේශ නොකරයි				

*ඉහත දක්වා ඇති තනුකකරණ, නැප්සැක් ඉසින යන්ත්‍ර (ඉහළ ධාරිතා ඉසින යන්ත්‍ර) සඳහා වේ. මිස්ට් බ්ලෝවර් ඉසින යන්ත්‍ර (අඩු ධාරිතා ඉසින යන්ත්‍ර) සඳහා දී ඇති මාත්‍රාව ජලය ලීටර් 40 ක දිය කර දළු නෙලන ඉඩම් සඳහා පමණක් නිර්දේශ කරනු ලබයි. තඹ (Cu) දිලීර නාශකයන්ගේ අඩු මාත්‍රාව සාමාන්‍ය මෝසම් තත්වයන් සඳහා වන අතර වැඩි මාත්‍රාව මීදුම් සහ වළාකුළු පිරි තත්වයන් සඳහා වේ.

3. කළු අංගමාරය

මෙම රෝගය පහතරට ප්‍රදේශයන්ට සීමා වේ.

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව	සටහන්	PHI (සති)
කොපර් ඔක්සයිඩ්	සීඅයිසී කොපර් 50% WP	N230000	0.25% ද්‍රාවණයකින් (ග්‍රෑම් 25 ක් ජලය ලීටර් 10 ක දියකර සාදාගත්) ලීටර් 450-500 ක් නව වගාවන් හොඳින් තෙමෙන සේ නැප්සැක් ඉසිනයකින් හෙක්ටයාරයකට යොදන්න.	වර්ෂාව දිගටම පැවතුනහොත් දින 14 කට පසු දෙවන ඉසීම සිදු කළ යුතුය	1
කොපර් හයිඩ්‍රොක්සයිඩ්	චැම්ප් කොපර් හයිඩ්‍රොක්සයිඩ් 37.5% WDG	N690000			
කොපර් සල්ෆේට්	කියුප්‍රොසැට් ® 345 g/L SC	P750000	0.25% ද්‍රාවණයකින් (මිලිලීටර් 25 ක් ජලය ලීටර් 10 ක දියකර සාදාගත්)		

4. රතු මලකඩ රෝගය

මෙම රෝගය පහතරට ප්‍රදේශවලට සීමා වේ. රසායනික ද්‍රව්‍ය යොදන විට ඇල්ගී බීජාණු හටගන්නා කොළ පැහැති කඳන් හා මේරූ කඳන්, ඉසින ද්‍රාවණයෙන් හොඳින් තෙත් කිරීම අත්‍යවශ්‍ය වේ.

සක්‍රීය ද්‍රව්‍යය(a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව	සටහන්	PHI (සති)
කොපර් ඔක්සයිඩ්	සීඅයිසී කොපර් 50% WP	N230000	0.25% ද්‍රාවණයකින් (ග්‍රෑම් 25 ක් වතුර ලීටර් 10 ක දියකර සාදාගත්) ලීටර් 170 ක් නැප්සැක් ඉසිනයකින් හෙක්ටයාරයකට වසරකට තුන් වරක් යොදන්න	ළපටි තේ සඳහා අප්‍රේල් මස අග දී පළමු යෙදීමත් මැයි මස දෙවන යෙදීමත් ජුනි මාසයේ තෙවන යෙදීමත් සිදුකරන්න	1
කොපර් හයිඩ්‍රොක්සයිඩ්	චැම්ප් කොපර් හයිඩ්‍රොක්සයිඩ් 37.5%WDG	N690000			
කොපර් සල්ෆේට්	කියුප්‍රොසැට් ® 345 g/L SC	P750000	0.25% ද්‍රාවණයකින් (මිලිලීටර් 25 ක් ජලය ලීටර් 10 ක දියකර සාදාගත්)		

5. පිළිකා රෝග (කඳ හා අතු පිළිකා සහ කඳ පාමුල පිළිකා)

නව වගාවන් සහ කප්පාදු කල ක්ෂේත්‍ර සඳහා පමණක් නිර්දේශ කර ඇත.

සක්‍රිය ද්‍රව්‍යය(a.i.)	වෙළඳ නාමය	ROPලියාපදිංචි අංකය	මාත්‍රාව	යොදන වාර ගණන
හෙක්සකොනසෝල්	ඉරේසර් ඊසි	F020100	0.05% ද්‍රාවණයකින් (මිලි ලීටර් 5 ක් ජලය ලීටර් 10 ක දියකර සාදාගත්) ලීටර් 170 ක් නැප්සැක් ඉසිනයකින් එක් වරකට හෙක්ටයාරයකට යොදන්න	නව වගාවන් සඳහා මාස 2-3ක කාල පරතරයකින් අවම වශයෙන් වාර 3 ක් යොදන්න
ටෙබුකොනසෝල්	ෆොලිකර් ඊසි	9370100		

6. මුල් රෝග

සක්‍රිය ද්‍රව්‍යය(a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	පර්යන්ත පඳුරුවලට ප්‍රතිකාර කිරීම	පාළු සිටවූ පැළ සඳහා ප්‍රතිකාර කිරීම	යොදන වාර ගණන
			ද්‍රාවණයෙන් මිලි ලීටර් 250 – 350ක් පස හොඳින් තෙමෙන සේ පඳුරකට යොදන්න*		
හෙක්සකොනසෝල්	ඉරේසර් ඊසි	F020100	0.2% ද්‍රාවනයක් (මිලි ලීටර 20 ක් ජලය ලීටර් 10ක දියකර)	0.1% ද්‍රාවණයක් (මිලි ලීටර 10 ක් ජලය ලීටර් 10ක දියකර)	මාස 2-3ක කාල පරතරයකින් අවම වශයෙන් වාර 3 ක් යොදන්න
ටෙබුකොනසෝල්	ෆොලිකර් ඊසි	9370100			
ප්‍රොපිකොනසෝල්	බම්පර්	N750000			

* සති 8 ක් දළු කැඩීම නවතා ප්‍රතිකාර කළ තේ පඳුරු විවේක ගැන්වීම අවශ්‍ය වේ

7. කප්පාදු පෘෂ්ඨ මත සිදුවන කඳ දිරායාම

සක්‍රිය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව/ හෙක්ටයාරයකට	සටහන්	PHI (සති)
ටා ඇසිඩස් 80 g/L SL (Tar Acids 80 g/L SL)	බෘනෝලියම්ප් ලැන්ටෙරියුම් (BrunoliumPlantarium)	N 220000	15% ද්‍රාවණයකින් (බෘනෝලියම් ලීටර් 1.5 ක් ජලය ලීටර් 8.5 ක දියකර) ලීටර් 35ක් ජලය ලීටර් 200 ක දියකර යොදන්න	හඳුනාගැනීමේ පහසුව සඳහා වර්ණයක් එක් කරන්න කප්පාදු කිරීමෙන් දින 2-3 සිට එක් එක් කප්පාදු තලයන් හි ආලේප කරන්න / ඉසින්න	අදාළ නැත

8. අශ්ව කෙඳි අංගමාරය

සක්‍රීය ද්‍රව්‍යය (a.i.)	වෙළඳ නාමය	ROP ලියාපදිංචි අංකය	මාත්‍රාව/ හෙක්ටයාරයකට	සටහන්	PHI (සති)
දිය ගැසූ හුණු (Hydrated Lime)	වාණිජමය වශයෙන් ලබාගත හැකි නිෂ්පාදන	අදාළ නැත	20% ද්‍රාවණයකින් (කිලෝ ග්‍රෑම් 2 ක් ජලය ලීටර් 10 ක දියකර සාදාගත්) ලීටර්1000 ක් නැප්සැක් ඉසිනයකින් හෙක්ටයාරයකට එක් වරකට යොදන්න	සෑම කප්පාදුවකටම පසු පඳුරෙහි රාමුව මතට ඉසින්න	අදාළ නැත

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
තලවකැලේ

ප්‍රකාශන හිමිකම

සියලුම හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ ලිඛිත අවසරයකින් තොරව මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම, ස්කෑන් කිරීම හෝ තොරතුරු ගබඩා කිරීම සහ ආපසු ලබා ගැනීම ඇතුළත්ව විද්‍යුත් හෝ යාන්ත්‍රික හෝ කිසිදු ආකාරයකින් නැවත පළ කිරීම හෝ සම්ප්‍රේෂණය කළ නොහැක.